ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2021

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයට ලැබී තිබුණු රු.125,576,971 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතු හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත කමිටුව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 මඟින් ඉදිරිපත් කර ඇත්තේ සංශෝධනයක් නොව යෝජනාවකි. එම නිසා 2021 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී මෙම යෝජනාව සැළකිල්ලට නොගන්නා ලදී. රජයේ විගණන කාර්යාලයෙන් උපදෙස් ලබා දෙන්නේ නම් ඒ අනුව 2022 වර්ෂයේ සිට රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 11 අනුව කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට උපකරණ සපයන ලද සැපයුම්කරුවෙකු වෙත සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.896,972 ක් ගෙවිය යුතු වුවද, එය රු.4,940,400 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය | ආයතනය වෙත ලබාදුන් විද්‍යාගාර උපකරණ අයිතම් අතුරින් අයිතම 02 ක් නිසි ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් ප්‍රමිතියෙන් යුතු අයිතම 02 ක් නැවත ලබාදෙන බවට සහතික කරමින් අදාළ සැපයුම්කරු රු.4,043,428 ක් වූ අයිතම 02 ක් නැවත | ආයතනයට සපයන භාණ්ඩ භාර ගැනීමට පෙර අදාළ පිරිවිතරයන්ට අනුකූලද යන්න පරීක්ෂාවකින් පසුව භාණ්ඩ ලැබීමේ කුවිතාන්සි නිකුත් කල යුතුය. ඒ අනුව වත්කම් ගිණුම්ගත කිරීමට |

| | | |
|---|---|---|
| තත්ත්ව ප්‍රකාශනයෙහි වැඩහල් හා පුහුණු උපකරණ වටිනාකම හා ණයහිමි ශේෂය රු.4,043,428 ක් වැඩියෙන් දක්වා තිබුණි. එසේම එම ආයතනය විසින් 2018 වර්ෂයේදී මිලදී ගෙන දැනට භාවිතා කරනු ලබන පුහුණු උපකරණ වෙනුවෙන් ගෙවා තිබූ රු.9,804,922 ක් අදාළ වත්කම් ගිණුමට මාරු නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අත්තිකාරම් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වැඩහල් හා පුහුණු උපකරණ වටිනාකම අඩුවෙන් හා අත්තිකාරම් ශේෂය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | රගෙන ගොස් තිබුණි. එම උපකරණවල වටිනාකම හිලව් කර ඉතිරි රු.896,972 ක වටිනාකම ගිණුම් වලින් හෙළිදරව් කිරීමට නිසි අධිකාරී බලයක් මේ දක්වා ලබාගෙන නොමැති අතර මේ සම්බන්ධව ඉදිරියේදී නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | කටයුතු කළ යුතුය. එසේම වත්කම් මිළදී ගැනීමෙන් පසු අත්තිකාරම් නිරවුල් කර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.110(ii) වගන්තිය | වාහන අනතුරු සම්බන්ධයෙන් හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වාහන අනතුරු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාමට විෂය ලිපිකරු දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 132,500,160 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.45,556,263 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.86,943,897 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රවර්ථන වර්ෂයේ පුනරාවර්ථන ප්‍රදාන හා ආයතනික ආදායම්වල වැඩිවීම මෙන්ම මෙහෙයුම් වියදම්වල අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 512 ක ඇස්තමේන්තුවක් මත දෙහිවල උසස් තාක්ෂණ ආයතනයේ ඉදිකර ඇති නායකත්ව ගුණාංග සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ නිම කිරීමට නියමිතව තිබූ මහල් 5 න් මහල් 3 ක් පමණක් රු.මිලියන 113.8 ක වියදමින් නිමකර 2017 පෙබරවාරි 21 දින ආයතනයට භාර දී තිබුණ ද ඉතිරි මහල් දෙකේ වැඩ නිම නොකිරීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල වාර්තාවේ දිනය දක්වාම නිශ්කාර්යව පැවතුණි. | ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු අවසන් කර දෙහිවල උසස් තාක්ෂණ ආයතනයට භාර දීමට 2022.03.26 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තුමා සමග පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී තීරණය කරන ලදී. | නිශ්කාර්ය වත්කම් භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කර උපයෝජනය කිරීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගත යුතුය.. |
| (ආ) | දෙහිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ විදුලි වියදම අවම කර ගැනීමේ අරමුණින් සූර්ය බලශක්ති පද්ධතිය සවිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමග එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව පද්ධතිය සවිකිරීමට අදාළ මූලික කාර්යය රු.මිලියන 19.8 ක් වැය කර 2019 ජුනි 07 දින නිම කර තිබුණ ද පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා තොග විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට වාර්තාවේ දිනය දක්වා ආයතනය අපොහොසත් වී තිබීම හේතුවෙන් 2019 ජුනි සිට 2021 දෙසැම්බර් දක්වා ආයතනයේ විදුලිය වෙනුවෙන් දරා ඇති රු.මිලියන 3.4 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | දෙහිවල උසස් තාක්ෂණ ආයතනය සඳහා තොග විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා විධිමත් ලෙස මිල ගනන් කැඳවා සැපයුම්කරුවකු තෝරාගෙන ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගෙන යමින් පවතී. | කොන්ත්‍රාත් කටයුතු කරගෙන යාමේදී සම්බන්ධිත කාර්යයන් ද කොන්ත්‍රාත් වැඩවලට සමගාමීව ප්‍රමාදයකින් තොරව නිම කිරීමට අදාළ කටයුතු මෙහෙය විය යුතුය. |
| (ඇ) | මහනුවර උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යටතේ දඹවෙල උසස් තාක්ෂණ අධ්‍යාපන අංශය ස්ථාපිත කර තිබුණ ද එහි අධ්‍යයන හෝ පරිපාලන කටයුතු සිදු නොවී පැවතියදී 2021 ජනවාරි මාසයේ සිට 2022 මැයි මාසය දක්වා ආයතනය පවත්වාගෙන යාම වෙනුවෙන් ජලය, විදුලිය, පවිත්‍රතා හා ආරක්ෂක සේවා ආදී වියදම් සඳහා දරන ලද රු.මිලියන 4.9 ක වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙම දඹවෙල පරිශ්‍රය තුළ ගොඩනැගිලි ඉදිකර වසරකට වැඩි කාලයක් භාවිතයට නොගෙන පැවතුන අතර අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම පරිපාලනමය වශයෙන් ස්ථාවර බවක් ඇති විය යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය කාර්යමණ්ඩලය සේවා නියුක්ත කරන ලදී. | දඹවෙල උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු කඩිනමින් ආරම්භ කර නිශ්කාර්ය වියදම් දැරීම නතර කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී කොළඹ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සිවිල් ඉංජිනේරු පාඨමාලාව සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු පාඨමාලාව සඳහා එහි ධාරිතාව අනුව බඳවාගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 260 ක්ව පැවතියදී එම ප්‍රමාණ ඉක්මවා අමතර ශිෂ්‍යයයින් 640 ක් ඇතුළත් කර ගැනීමට කළමනාකරණය විසින් අයදුම්පත් රඳවා ගැනීම හේතුවෙන් අමතර ශිෂ්‍යයන්ට දෙවන හා තෙවන කැමැත්ත මත ගාල්ල හා යාපනය යන උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනවල පාඨමාලාවලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට වගබලා ගන්නා අතර ,අදාළ ආයතන වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරමි. | ආයතනයේ පාඨමාලා සඳහා අයදුම්කරන සිසුන්ට ලබා ඇති සුදුසුකම් මත පාඨමාලාවලට ඇතුළත් වීමට අවස්ථාව සළසා දිය යුතුය. |
| (ඉ) | යාපනය උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සමාගමක් වෙත 2016 නොවැම්බර් 10 වන දින රු.මිලියන 36.9 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් ගෙවා ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබුණ ද පෞද්ගලික පාර්ශවයක් විසින් ඉඩමෙහි අයිතිය සම්බන්ධව යාපනය දිස්ත්‍රික් උසාවියේ පවරා තිබූ නඩුවේ තීරණය මත 2017 මාර්තු 09 වන දින සිට අදාළ ඉඩමට ඇතුළුවීම උසාවිය විසින් තහනම් කර තිබුණි. මේ හේතුවෙන් වාර්තාවේ දිනය දක්වාම අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ද තවදුරටත් ප්‍රමාද වී තිබුණි. | පෙන්වා දී ඇති කරුණ සම්බන්ධයෙන් එකඟ වන අතර, තව දුරටත් නඩු කටයුතු අවසන්ව නොමැති වී ඇති බැවින් නිරවුල් කිරීමට නොහැකි වී ඇත. | ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමකින් තොරව ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකිරීමටත් නඩු නිමිත්තක් බවට පත්ව ඇති සිව් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් භූමියේ නඩු කටයුත්ත නිරවුල් වූ වහාම අදාළ අත්තිකාරම් මුදල නිරවුල් කර ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | දිස්ත්‍රික්ක 8 ක ගොඩනැගිලි ඉදිකර වසර 03 සිට වසර 12 ක කාලපරිච්ඡේදයක් තුළ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යනු ලබන ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට වාර්තාවේ දිනය දක්වාම අපොහොසත් වී තිබුණි. | ඉඩම් සම්බන්ධ නීත්‍යානුකූලව පවරා ගැනීම් කටයුතු වර්ෂ 2019 සිට ආරම්භ කර ඇති අතර, 2021 වර්ෂය තුල එම පියවරයන් කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව බදුල්ල (නව ඉඩම) සඳහා ගෙවිය යුතු මුදල් පාලක සහා එකගතාවක් සහිතව ගෙවා නීත්‍යානුකූලව පවරා ගැනීම් | ඉඩම් නියමානුකූල කිරීමේ කටයුතු කඩිනම් කර අදාළ ඉඩම් ආයතනයට පවරා ගැනීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අවසන් අධියරට පැමිණ ඇත. අනෙකුත් ඉඩම් සම්බන්ධවද කඩිනම් පියවර ගෙන ඇත. | |
| (උ) | 2018 වර්ෂයේ පෞද්ගලික සැපයුම්කරුවකු විසින් ආයතනයට සපයා තිබූ රු.මිලියන 4 ක් වටිනා උපකරණ, පිරිවිතරවලට නොගැලපීම හේතුවෙන් සැපයුම්කරු විසින් ආපසු රැගෙන ගොස් තිබූ අතර දෝෂ සහගත තත්ත්වයෙන් ආයතනයට සපයා තිබූ රු.මිලියන 22.5 ක් වටිනා වැඩහල් උපකරණ වාර්තාවේ දිනය වන විට වසර 4 ක කාලයක් ආයතනයේ රඳවාගෙන තිබුණ ද එම උපකරණ උපයෝජනය කිරීමට හෝ නැවත හරවා යැවීමට වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සපයන ලද ආයතනයේ නිලධාරීන් ආයතනයට පැමිණ භාණ්ඩ නිරීක්ෂණය කර, දෝෂ නිවැරදි කිරීමේ කාල සටහනක් පසුව ලබා දෙන බවට පොරොන්දු විය. එසේ වුවද මේ සම්බන්ධව විවිධ අවස්ථා කිහිපයකදී ඔවුන් වෙත සිහි කැඳවීම් කළ ද මේ දක්වා ප්‍රතිචාර දැක්වීමක් සිදු කර නොමැති බැවින් ඉදිරි කටයුතු කරගෙන යාමට නොහැකි වී ඇත. මේ පිළිබඳ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා කටයුතු කරමි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සැපයුම්කරු විසින් ආයතනයට සපයන භාණ්ඩ භාර ගැනීමට පෙර අදාළ පිරිවිතරයන්ට අනුකූලද යන්න පරීක්ෂාවකින් පසුව භාර ගැනීමට කටයුතු කළ යුතු අතර යම් නොගැලපීමක් ඇත්නම් අදාල භාණ්ඩ ප්‍රතික්ෂේප කළ යුතුය. |
| (ඌ) | පවිත්‍රතා සේවා ප්‍රසම්පාදනයට අදාළ ප්‍රසම්පාදන නීතිරීති හා මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීම සම්බන්ධව ආයතනයේ සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු 2018 වර්ෂයේදී චෝදනාවට ලක්වීම හේතුවෙන් එම නිලධාරියා ධුරයෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබුණ ද ඔහුට හා ඒ සම්බන්ධව චෝදනාවට ලක්ව සිටින සෙසු නිලධාරීන්ට එරෙහිව අදාළ විනය ක්‍රියාමාර්ග වාර්තාවේ දින දක්වා අවසන් කර නොතිබුණි. | එම නිළධාරියාගේ විනය බලධාරියා වන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති වරයා වන අතර, ඔහු සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණයක් මේ වන විට පවත්වා අවසන් කර ඇති අතර, එහි විනය පරීක්ෂණ වාර්තාව මේ වන තෙක් අප ආයතනයට ලබා දී නොමැත. | අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාළ විනය බලධාරියා අමාත්‍යාංශ ලේකම්වරයා වන බැවින් අමාත්‍යාංශ මට්ටමින් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයක් තුළින් අදාළ නිලධාරියා සම්බන්ධ විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රධාන කාර්යාලය ඇතුලු ආයතන 19 ට අදාලව වර්ෂය තුල ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 1,489 ක් වූ ප්‍රසම්පාදන හා මෙහෙයුම් කාර්යයන් 157 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | රටේ පැවති කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් අසාමාන්‍ය ලෙස මිල ගණන් ඉහල යාම සහ මිල ගණන් කැඳවුවද සැපයුම්කරුවන් මිල ගණන් ඉදිරිපත් නොකිරීම ආදි කරුණු හේතුවෙන් මෙම ප්‍රසම්පාදන හා මෙහෙයුම් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක කරා ළඟාවීමට හැකිවන අයුරින් ආයතනයේ කටයුතු මෙහෙය විය යුතුය. |